සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

නම/විභාග අංකය :- ................................................ කාලය : පැය 01 යි.

සැලකිය යුතුයි.

- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- (ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථයට වඩාත් සමීප අර්ථය ඇති වරණය තෝරන්න.

01. සිංහල අවුරුදු සමයේ දී බොහෝ සිංහලයෝ **ඉස්තාපුවත් නොමැතිව** වැඩ කරති.
(1) ඉක්මනින් (2) නිහඬව (3) අවිවේකීව (4) සෙමින්

02. වත්පොහොසත්කම් ඉහළ යන විට බොහෝ දෙනෙකුගේ **හිළව් ඉදිමෙන** බව සමාජයේ පවතින මතයයි.
(1) හිස අවුල්වීම (2) හිසෙහි රෝගයක් පැවතීම
(3) තනතුරෙන් ඉහළ යාම (4) අහංකාරයට පත්වීම

03. ඕනෑම මොහොතක **කෙන්ද කන්ද කිරීමට** දක්ෂයෝ අප අතර සිටිති.
(1) අනුන් මුළා කිරීමට (2) කඳු කපා සමතලා කිරීමට
(3) නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කිරීමට (4) කුඩා දෙයක් විශාල කොට පෙන්වීම

04. උත්සව සමයෙහි දී තමන්ගේ **මඩිය තර කර ගැනීමට** බොහෝ වෙළෙන්දෝ උත්සාහ කරති.
(1) ව්‍යාපාර සඳහා මුදල් යෙදවීමට (2) නොහික්මී ලෙස තම ලාභය වැඩිකර ගැනීමට
(3) වැඩිපුර භාණ්ඩ විකුණා ගැනීමට (4) තම ගබඩා සම්පූර්ණයෙන් පුරවා ගැනීමට

- අංක 5 සිට 8 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

05. භාෂාවේ විවිධ ස්වරූප ........................................ කරගනිමින් කාව්‍යාත්මක නිර්මාණය කිරීමට කවීහු උත්සාහ දරති.
(1) සුසංයෝජනය (2) ප්‍රේමාව (3) සංයෝජනය (4) ප්‍රවිතය

06. බොහෝ සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවලට ........................................ වී ඇත්තේ පන්සිය පනස් ජාතක පොතයි.
(1) අනුග්‍රහය (2) ආභාසය (3) මූලාශ්‍රය (4) ආධාරක

07. කුන්තීනාගේ ගමින් පේතෘවිරාගේ සිතෙහි ඇතිවන........................................ අවට පරිසරයේ චිත්‍රණාවලිය වර්ණනා කිරීමෙන් තුළ ගන්වයි.
(1) සන්තාපය (2) සම්භෝගය (3) පශ්චාත්තාපය (4) ප්‍රහර්ෂය

08. පණ්ඩිත් අමරදේව සූරීන් ........................................ සංගීතඥයකු බව විචාරක පිළිගනිති.
(1) කෘතගුණ (2) කෘතහස්ත (3) කෘතවේදී (4) කෘතප්‍රතිකාර

09. අකාරාදී පිළිවෙළට වචන පෙළ ඇති වරණය තෝරන්න.
(1) ආගමික, ආරෝපණ, ආලේපන, කවිවර (2) උත්කර්ෂණ, අභ්‍යාපනික, අගලුම්, සටහන
(3) ආන්දෝලන, අවිධිම, තම්පතාය, ගැළපෙන (4) ජ්‍යාමිතික, අලංකමන්ද, උත්පුම්, ආශ්වාද

10. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ආශිර්වාද, ගවේෂණ, ධර්මිෂ්ඨ, මුහුණුවරුනු (2) අභිලාෂ, පිළිගාමී, ලෙන්ගතු, විරෝදාර
(3) ශෛර්යවත්, විශ්ලේෂණ, ප්‍රදීපනය, දුර්ලභ (4) සංශෝධන, පළිබෝධක, වාර්තාව, පරිසනායක

11. මිශ්‍රාක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.
(1) ෂ, ඹ, ඛ, ඟ, ෆ (2) ඝ, ඡ, ධ, ත, ප (3) ප, ඵ, ඞ, ග, ඹ (4) ග, ජ, ඩ, ද, බ

12. මුලින් දැක්වෙන අක්ෂර වර්ගයට අයත් අකුරක් නොයෙදුණු වචනය සහිත වරණය තෝරන්න.
(1) මූර්ධජ අක්ෂර - නාඩු, පටන්වරය, ගාගය, කලකණ (2) මහාප්‍රාණ අක්ෂර - ඛනිජ, දන්තධාතු, පුනිඵල, සාගය
(3) මිශ්‍ර අක්ෂර - මහය, පයෝම, බෝධිය, භාරනය (4) ඌෂ්මාක්ෂර - ශාමිකය, සංඥාව, ශල්‍යකර්ම, සදාශ

13. පහත දී ඇති පදවල පළමු අක්ෂරයෙහි පිළිවෙළින් පාපිල්ල, කෙටි ඇදපිල්ල, දීර්ඝ ඉස්පිල්ල, රකාරාංශය යෙදී ඇති වරණය තෝරන්න.
(1) පුෂ්පය, ප්‍රවීණ, පිදුරා, ආදරය (2) රුචිර, පැලය, කීර්තිය, ප්‍රශය
(3) කුවිත්ත, සැලය, රසය, කුමය (4) බාලිකාව, පැමිණිල්ල, කීපයක්, ශ්‍රමය

14. උක්ත නාමපද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) ගායිකාවන්, ළමයෙක්, හිලිපය, කුමරෙක් (2) සිවුරයෝ, දරුවෝ, මවක්, විදුලිකයෝ
(3) අවි, මැසිකිවියන්, ඔවුන්, පමණයෙක් (4) නමිකරුවන්, හිලියන්, විශිෂ්ටියෝ, ගුරුවරුන්

15. උපසර්ගයක් නො යෙදී ඇති වචනය සහිත වරණය වන්නේ,
(1) පුනිඵල, මිනිගෙහිම, ප්‍රතිපත්ති, සංවර්ධන (2) අභිසිරි, දුශ්චරිත, අදහ, නිර්මල
(3) උපන, සංස්ථාන, අධිකරණ, අවනිත (4) සන්නමන, ප්‍රධිග, විපත, අධිකාර

● අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල තද කළ අකුරෙන් මුද්‍රිත පදයට ගැළපෙන වරණය තෝරන්න.

16. **අසනු** මැන දැන් අඳුරු වියැවු
(1) පූර්ව ක්‍රියාවකි (2) විධි ක්‍රියාවකි (3) මිශ්‍ර ක්‍රියා පදයකි (4) ආශිර්වාද ක්‍රියාවකි

17. අර්වයට ලයාම ගහනයොට කතුලේ ඉන්න **මැස්සා** අන්ට ඉස්සුවාලු
(1) උත්තම පුරුෂ නාමපදයකි (2) මධ්‍යම පුරුෂ නාමපදයකි
(3) සර්ව නාම පදයකි (4) ප්‍රථම පුරුෂ නාම පදයකි

18. ගලා වයෙට් **නිල් දියවර අපට අම්මා**
(1) උපමාවකි (2) රූපක පදයකි (3) නිපාත පදයකි (4) නාමපදයකි

19. වර්තමාන **ළමා** පරපුර ක්‍රීඩාවෙන් බැහැරවීම නිසා ලෙඩ රෝගවලට ගොදුරුවීමේ ප්‍රවණතාව වැඩි ය.
(1) ක්‍රියා විශේෂණයකි (2) නිපාතයකි (3) නාම විශේෂණයකි (4) කෘදන්තයකි

20. **බලයි** යන ක්‍රියාපදයේ අතීතකාල ඒක වචන මධ්‍යම පුරුෂ ආඛ්‍යාතය වන්නේ,
(1) බලනු (2) බැලීහි (3) බලහි (4) බැලෙහි

21. දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
(1) උපසර්ග - විශේෂ, ප්‍රබල, දුගත, සුනිල් (2) විධි ක්‍රියා - කරන්න, බල, නියවිය, දියව්
(3) නිපාත - වැනි, සුරු, දැයිවා, ම (4) මධ්‍යම පුරුෂ නාම - තෝ, තුඹ, යුෂ්මතිය, ඔවුන්

22. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) උදක - නිරුදක (2) ආධුනික - ප්‍රවීණයන් (3) ගාඪ - පොළම (4) උත්තීර්ණ - අවතීර්ණ

23. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන වරණය සහිත පිළිතුර තෝරන්න.
(1) මිතුරා - සඛි, සබඳ, සගයා, මිත් (2) සමුද්‍ර - අර්ණව, සිඳු, ලවණිඳු, සාගරය
(3) වනය - අරණ්‍ය, වලාහක, වල්, අඩවි (4) පිළිබිඹු - ප්‍රතිරූප, ප්‍රතිබිම්බ, ප්‍රතිමා, පිළිමිඹු

24. යුගල පදයක් නොවන වරණය සහිත පිළිතුර තෝරන්න.
(1) කඳුකුඩු, පහිනඩි, වාදගේද, ගරුගම්බු (2) හොඳමයා, හුරුපුරුදු, තැතිගැනීම, අස්පස්
(3) උදවිපදවි, ගහුලදුන, අගහිඟ, ලෙඩිපාඩු (4) අඩිආඩුඩ, අරම්පුදම්, අහම්ට, ගොඩින්මඩින්

25. නිවැරදි ලෙස විසන්ධි වී ඇති පද යුගල වන්නේ,
(1) යාතු + සමිමින - ඇදුරුදු + ඇමා (2) දක් + අත - දුර් + අගත
(3) පවන් + මන් - රළ + අවුත් (4) ක්‍රියෝ + ත්සවය - මඩුනා + උන්

26. සැම පදයකම නාම ප්‍රකෘති පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ළමා, බලු, බමර, වැදි
(2) හස්දත්, ගිරා, බමුණෙක්, ගෙරි
(3) මහලු, පුටුව, තරුණ, ගව
(4) තඩියා, රිළා, අලි, බිළාල

27. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් ප්‍රවාදය වන නිවැරදි ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) න් ස බු ර ප ණ
(2) සි ර ල ප ක ය බ ය් ධ
(3) ශි ශා පු ත ය
(4) සි වු හා මි ලා ෂ

● අංක 28, 29 යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

28. ආතාට අටුකොළ දීම

(1) පුදුසු කෙනෙකුට යමක් දීම
(2) ගණිකාවන් සරදරයට පත්වීම
(3) ප්‍රයෝජනයට ගත නොහැකි දෙයක් දීම
(4) අනුන් රවටන්නට යාමෙන් තමන් රැවටීම

29. ගිරියාගේ පිටිවුණු එකා අඹේට නැඹීම

(1) සිසි අඳුරතින් ගිදහයක් නැති
(2) එක විපතක් වූවෙකුට තව විපතක් වීම
(3) කිසිදු වග විභාගයක් නැතිව වැඩ කිරීමයි
(4) නිෂ්ඵල කාර්යයකි.

30. පහත (අ) කොටසේ දැක්වෙන වචනවල අර්ථය (ආ) කොටස සමග අනුපිළිවෙළින් නිවැරදිව ගැළපෙන වරණය වන්නේ,

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| A | ශෛලිල | E | තැළමි |
| B | ඔපලොයා | F | විසදුම |
| C | සෝමර | G | රැස්වුන |
| D | සංසාමව | H | කුන්නාසුව |

(1) G E H F (2) H F G E (3) F E G H (4) F G H E

31. පහත සඳහන් කවියේ හිස්තැනට සුදුසු වරණය තෝරන්න.

මඩ වක පිට වක පත් — වැරටිල්ලා
.................................... — ..................
ඉස ගේ පුපුරටි දත් කඩ — හොල්ලා
තිගේ පැම් බමුණා කුණු කෙළ — හොල්ලා

(1) කලේ කැඩින් යසය තැප පටි — ඇතලා
(2) යාගේ උත් බමුණා බම — පෙරළා
(3) දෙපටට කුඳු ගැසි වතර — කුදුල්ලා
(4) යොදේ විදිශ යස විදුමට — මෙකලා

32. ප්‍රාදේශීය ජන ව්‍යවහාරයේ වන ඌව පළාතේ "අම්මණ්ඩි" යනුවෙන් හඳුන්වන්නේ,

(1) මැණියන් (2) අම්මා (3) නැන්දා (4) මහම්මා

33. A රජය පාසල් දරුවන්ට පෙළ පොත් නිකුත් කරයි. දරුවන් ළඟ පෙළ පොත් නැත.
B පෙළපොත දරුවන්ගේ පරිහරණයටයි. දරුවෝ පොත පත ගෙන කියවති.
C ගුරුවරු පිසු දරුවන්ට මඟ කියති. එමඟ යන්නන් විරලය.
D සමාජයට ආර්ථිකයට බුද්ධිමතුන් අවශ්‍යයි. රජයේ වියදම් එළලායී විය යුතුයි.

ඉහත වාක්‍ය තනි වාක්‍ය වශයෙන් ගැළපීමේ දී නිපාත පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වනුයේ,

E - වුවත් F - ද G - නමුත් H - නිසා

(1) F,G,H,E (2) F,E,G,H (3) H,G,F,E (4) G,E,H,F

● පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට ඇත්වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,

34. මහා විජයබාහු කුමාරයා පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක් ගෙනාවා.

(1) මහා විජයබාහු කුමාරයා පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක් ගෙනාවේය.
(2) මහා විජයබාහු කුමාරයාණන් පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක ගෙනාවේය.
(3) මහා විජයබාහු කුමාරයා පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක ගෙනාවේ ය.
(4) මහා විජයබාහු කුමාරයාණෝ පාණ්ඩ්‍ය දේශයෙන් කුමාරිකාවක ගෙනාවේ ය.

papers.lk

35. පහත දැක්වෙන කවියේ තද කළු අකුරින් මුද්‍රිත පද සඳහා යෙදෙන අර්ථ පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

පුසිරිත මිපක **දුසිරිත** කිසි නැගෙන      හැත
**විසි** වන සියලු **සසිසුරු** රිපි ලෙප ම      ඇත
නිපි කල වැසි ද **සස් පල** නැගි නැගී      ගත
මෙපියල් පැයෙන් සිරි ලත ලෝ මුදුන්      දත

(1) බෝග අස්වනු, කැමති, නරක සිරිත්, යස ඉසුරු
(2) නරක සිරිත්, කැමති, යස ඉසුරු, බෝග අස්වනු
(3) බෝග අස්වනු, යසඉසුරු, නරක සිරිත්, කැමති
(4) නරක සිරිත්, කැමති, බෝග අස්වනු, යස ඉසුරු

- **ප්‍රශ්න අංක 36 සිට 38 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය සහිත වරණය තෝරන්න.**

36. (1) සියලු මිනිස්සු සත්‍ය ගරුක විය යුතුයි. (2) මම මහසෑදම පිරිය යුතුයි. (3) අප ගිලනුන්ට උවටැන් කරනු වේ. (4) සිසුහු පන්තියට පැමිණ නැත.

37. (1) දරුවන් කියවීමෙන් ඈත්වන්නේ ඇයි? (2) දක්ෂ ක්‍රීඩකාවක් වන්නේ කෙසේ ද? (3) පන්ති කාමරයේ සියලු සිසුන් දක්ෂයෝය. (4) අපි සාමය උදා කරගන්නේ කවදාද!

38. (1) මා විසින් පුතුන් රකිනු ලබයි. (2) ගුරුවරුන් විසින් සිසුහු යහමග යවනු ලැබූ හ. (3) අප විසින් නුඹ දකිනු ලැබුණෙනු (4) වෛද්‍යවරු විසින් රෝගීහු සුවපත් කරනු ලබති.

39. පහත සඳහන් ගීත ඛණ්ඩයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

පටහැණි වෙන්ටා නොව මිතු අණටා
වෙන මග ගැලවෙන්ට
නොපෙනෙන කලටා පැරපෙනු තුමටා
මා දැන් වළකන්ටා

(1) මා වළක්වන්ට පැරපෙන්නේ තුමට? ඔහුගේ අණට එකඟ වෙනවා හැර.
(2) ඔහුගෙන් ගැළවෙන්ට වෙන මගක් ඇති නිසා මා වළක්වන්නේ ඇයි?
(3) නොපෙනෙන කලට වෙන මගක් නැති නිසා මා වළක්වන්නේ ඇයි?
(4) ඔහුගේ අණට පටහැනි වෙන්ට හෝම ගැළවෙන්ට වෙන මගක් නොමැති නිසා මා දැන් වළක්වන්ට පැරපෙන්නේ තුමට?

40. දී ඇති ඡේදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

සාර්ථක කෙටි කතාවක් නිර්මාණය කිරීම ආයාසමක ව කළ හැකි දෙයක් නොවේ. ඒ සඳහා නිරන්තරයෙන් පුහුණු වීම හෙවත් සතතාභ්‍යාසය අවශ්‍ය ය.

(1) නූතන කෙටිකතාකරුවෝ සතතාභ්‍යාසයේ නිරත විය යුතුය.
(2) සාර්ථක කෙටිකතාවක් ආයාසමකව කළ හැක්කක් නොව සතතාභ්‍යාසයෙන් කළ යුත්තකි.
(3) සාර්ථක කෙටිකතාවකට ආයාසමක හා සතතාභ්‍යාසය අවශ්‍යය.
(4) නිරන්තර පුහුණුවීමෙන් ආයාසමක වූ සාර්ථක කෙටිකතා නිර්මාණය කළ හැකිය.

papers.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම/විභාග අංකය :- ............................................................ කාලය : පැය 02 යි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

**අංක (i) සිට (x) තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. පිළිවෙළ අනුව නොවන්නට ඔබ පිළිතුරු ලියන්නේ නම්, එම අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

01. (i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.
(අ) අගල (ආ) අගළ

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සාවද්‍ය ය. එම වචන දෙක උපුටා නිවැරදි කර ලියන්න.
"කලාවට අධිපති සහ පාරිශුද්ධභාවයේ සංකේතයක් වන සරස්වතී දේවිය හින්දු සම්ප්‍රදායේ ප්‍රමුඛ දේවතාවියකි."

(iii) පහත සඳහන් වචනවල තද කළු අකුරින් මුද්‍රිත විල්ලම් නම් කරන්න.
(අ) **ගී**තය (ආ) සරුංගලය

(iv) පහත සඳහන් පදවල අනුක්ත පද ලියන්න.
(අ) කුමාරයෝ (ආ) කිලිලක්

(v) තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා ප්‍රභේදය නම් කරන්න.
(අ) ඉදි කළ වැව් **බිඳුණේ** දුනෙන් (ආ) මැට්ගොඩ අහා කසපොරුවේ තියන්නේ

(vi) පහත සඳහන් පදවල විරුද්ධාර්ථ පද ලියන්න.
(අ) ආයුධ (ආ) ජනාකීර්ණ

(vii) පහත වාක්‍යයේ යෙදී ඇති උපසර්ග දෙකක් උපුටා ලියන්න.
අතිදක්ෂ ලෙස අභිධර්මය දෙසූ ගාහිමියන්ට උපාසකයෝ දහම් පඬුරු පූජා කරති.

(viii) පහත දැක්වෙන අදහසට අදාළ ප්‍රස්තා පිරුළ ලියන්න.
(අ) අය මාර්ග මුළුමනින්ම විනාශකර දැමීම
(ආ) අරමුණින් තොරව වැඩ කිරීම

(ix) ඉරි ඇඳි පද වල අර්ථය ලියන්න.
සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කිරීම ආකස්මිකව කළ හැක්කක් නොවේ. ඒ සඳහා සහජ ගුණය අවශ්‍ය වේ.

(x) පහත ප්‍රාදේශීය ව්‍යවහාරයෙන් ලියා ඇති වාක්‍ය පොදු ව්‍යවහාරයෙන් ලියන්න.
(අ) "ඊයා ගියා පහලයන් අයිට"
(ආ) "කුවප්පුවට පොල් මයනවද?"

(ලකුණු 20)

02. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අතීත සිංහලයා සිය ජීවිතයේ දුක සැප සමව දරාගත් බව ජනකවිය සාක්ෂි දරයි. ජනකවි කලක් තිස්සේ මුඛ පරම්පරාගතව පැවති නමුදු ක්‍රමයෙන් ව්‍යාප්ත වී අද වන විට එය උසස් සාහිත්‍යාංගයක් බවට පත් වී ඇත. ජීවිතයේ විවිධ ප්‍රශ්න විසඳා ගැනීමට මග පෙන්වීම මෙන්ම ඓතිහාසික සිද්ධීන් ද මුල්කර ගත් ජනකවි අපට සරු උපදෙස් සපයයි. ජනතාවගේ කලාව ද අද වන විට බොහෝ ප්‍රචලිත වී ඇත. මේ නිසා සිංහල ජනතාවට වඩාත් අර්ථවත් වී ඇත.

(ආ) අතීතයේ දී අපේ මව්බිම දෙස පරරටුන්ගේ ඇස යොමු වූ තරම් කොතරම් ද යන්න කිවහොත් ඔවුන් විසින් ශ්‍රී ලංකාව හඳුන්වන ලද්දේ "පෙරදිග මුතු ඇටය" යනුවෙනි. ලෝකයේ ඕනෑම රටක පවතින දේශගුණය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පැවතීම විශේෂත්වයයි. එමෙන්ම ස්වභාව සෞන්දර්යය, ඓතිහාසික උරුමය, ස්වාභාවික සම්පත්, සශ්‍රීකත්වය, ජාතික නිදහස යන ඉසව් ඔස්සේ විමසුම් ඇසින් බැලූ කල ද අපේ මව්බිම පිළිබඳ ඇතිවන්නේ අභිමානවත් හැඟීමකි.

(ඉ) වංචා, දූෂණ, ළමා අපයෝජන අපචාර, වෙඩිතැබීම් ආදී අපරාධ රැසක් පසුගිය කාල වකවානුවේ සිදු වූ බව පෙනේ. ඒවා, ඉන් ජනතාවගේ ආකල්පමය පරිහානියක් සිදු වී ඇති බව ධ්වනිත වෙයි. අපරාධ රැල්ල මැඩලීම සඳහා ආකල්ප සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය යන්ත්‍රණය ශක්තිමත් කිරීමට කාලය එළැඹ ඇත. මෙහිදී පාසල මගින් නව පරපුරට මෙන් ම පාසලෙන් සමාජයට ද ආකල්ප සංවර්ධනය කිරීමේ ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කිරීම කළ හැකිය. මෙයට අමතර ව නීතිමය පියවර ශක්තිමත් කළ යුතුව ඇත.

(ඊ) අද පාසල් සිසුන් අතර පාඨනය දැරීම ඉතා දුර්වලය. මීට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ පොත්පත් කියවීම ඔවුන්ගෙන් ඈත් වී තිබීමය. පාසල් කාලයෙන් පසු අමතර පන්ති සඳහා සහභාගිවීමත්, රූපවාහිනිය ආදියට ඇබ්බැහිවීමත් ඇතැම් අය මේ සඳහා හේතු ලෙස දක්වති. කියවීම යළිත් පාසල් සිසුන් අතර ජනප්‍රිය කිරීමට පියවර ගත යුතුය. (ලකුණු 25)

03. පහත සඳහන් ඡේදය වචන 40 - 45 වන සේ සාරාංශ කොට ලියන්න.

ශ්‍රී ලංකාවේ වාපි හා වාරි තාක්ෂණය පිළිබඳ අවධානය යොමු කරද්දී මතු වී පෙනෙන රාජ්‍ය පාලකයෝ කිහිප දෙනෙක් සිටිති. තම මුළුමනින් ආර්ථික සංවර්ධනයට ඉමහත් සේවයක් කළ මහසෙන් රජතුමාගෙන් රටට වූ සේවය පිළිබඳව ඓතිහාසික මූලාශ්‍රයක් වූ මහාවංශයේ සඳහන් වන්නේ සුළු වශයෙනි. ලංකා ඉතිහාසයේ මහසෙන් රජතුමාට හිමිතැන ලබාදීමට උපකාරී වී ඇත්තේ පුරාවිද්‍යා ගවේෂණයන් හා වාරි මාර්ග කටයුතුය. ඇළහැර වැව, මින්නේරි වැව, කවුඩුලු වැව මහසෙන් රජුගේ වාරි කර්මාන්ත අතර විශේෂ වේ. සාමාන්‍ය මනුෂ්‍යයන් කෙරෙහි නොපවතින බලයක් රජතුමා කෙරෙහි තිබුණු බව, ඔහු කළ විස්මය ජනක කර්මාන්ත තුළ ජනතාව විශ්වාස කළහ. එනිසා මහසෙන් රජු දෙවියෙකු සේ සලකා වැඳුම් පිදුම් කළහ. මහසෙන් රජතුමාගෙන් වූ සේවය වාරි මාර්ග අංශයට පමණක් සීමා නොවූ අතර මහා විහාරය යළි ගොඩනැගීම හා ජේතවන දාගැබ කරවීම ද, තවත් වෙනත් විහාර කීපයක් කර වීම ගැන ද ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වේ. (ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාෂාව මානව වර්ගයාට සුවිශේෂී වූ සංසිද්ධියක් වශයෙන් හැඳින්විය හැකිය. එයින් ගම්‍ය වන්නේ වෙනත් සත්ත්ව වර්ගවලට ආවේණික වූ සන්නිවේදන මාර්ග භාෂාවක් ලෙසින් හැඳින්විය නොහැකි බවයි. මී මැස්සන් වැනි ඇතැම් සත්ත්ව කොට්ඨාසවල සන්නිවේදන ක්‍රම මානව භාෂාවලට යම් යම් සමානතා දක්වතත් මානවයා සතු භාෂාව සත්ත්ව සන්නිවේදනයට වඩා බොහෝවින් ප්‍රබල ද සංකීර්ණ ද වේ. මිනිසා භාෂාව යොදා ගන්නේ හුදෙක් තම පැවැත්ම සඳහා පමණක් නොවේ. අනුන් දැනුම්වත් කිරීමට මෙන් ම අනුන්ට තොරතුරු දැනුම්දීමට ද විනෝදාස්වාදය සැපයීමට මෙන්ම සුහදතාව ගොඩ නගා ගැනීමට ද මිනිසා භාෂාව යොදා ගනී. වේදනාවක් නැති විටක පවා වේදනාවකින් සේ ගයමින් ගීයක් ගැයීමට නළුවෙකුට හෝ කිවිඳියකට පුළුවන. මිනිසා භාෂාව ලබා ගන්නේ සහජයෙන් ම නොවේ. ඔහු කටහඬත් කතා කිරීමේ ශක්තියත් සහජයෙන්ම ලබයි. එහෙත් ඒ කටහඬත් ශක්තියත් යොදා කතා කරන්නේ කවර භාෂාව ද යන්න තීරණය වන්නේ ඔහු හැදී වැඩෙන සමාජ පරිසරය අනුවයි.

මානව භාෂාව සත්ත්ව සන්නිවේදනයට වඩා ප්‍රබලවීමටත් සංකීර්ණවීමටත් තවත් හේතුවක් වන්නේ එය සංකේතවලින් සැදී තිබීමයි. සත්තු සන්නිවේදනයේ දී සංකේත නො යොදති.

(i) මිනිසා කතා කරන්නේ කවර භාෂාවෙන්ද යන්න තීරණය කරන සාධකය කුමක් ද?

(ii) සතුන්ගේ ශබ්ද භාෂාවක් ලෙස සැලකිය හැකි නොවන්නේ කුමක් නිසාද?

(iii) මිනිසාට සහජයෙන්ම ලැබෙන ශක්තීන් දෙකක් ගැන මේ ඡේදයේ කියැවේ. ඒ මොනවාද?

(iv) භාෂාවෙන් මිනිසාට ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.

(v) 'උපතින් ම' හා 'හැඟෙන්නේ' යන අරුත් දක්වන පද දෙක ඡේදයෙන් උපුටා ලියන්න. (ලකුණු 10යි)

05. අයාලේ යන සුනඛයින් හා වෙනත් සුරතල් සතුන් නිසා ලෝකය පුරා ජලභීතිකා රෝගයට ගොදුරු වන මිනිස් ජීවිත සංඛ්‍යාව ඉහළ යයි. මෙම රෝගයට ප්‍රතිකාර නොමැති වුව ද නිසි කලට එම සතුන්ට එන්නත් ලබාදීමත් අයාලේ යාමට නොදීමත් යන ක්‍රම තුළින් රෝගය මර්දනය කළ හැකිය. මේ තොරතුරු ඇතුළත් කරමින් වසර 2020 වන විට ශ්‍රී ලංකාවෙන් ජලභීතිකා රෝගය තුරන් කිරීමේ අරමුණින් කොළඹ පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය මගින් මහජනතාව දැනුම්වත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් සකසන්න. (වචන 100ක් පමණ යොදා.)

**නැතහොත්**

ඔබ පදිංචි ප්‍රදේශයෙහි පවතින කුඹුරුයායෙහි දීර්ඝ කාලයක් තිස්සේ ජලය රැඳී තිබෙන නිසා ඒ වගාවෙන් නිසි අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි වී ඇත. ප්‍රදේශයේ ගොවීන් පිරිසක් එකතු වී අලුතෙන් ඇළ මාර්ගයක් කැපීමට අදහස් කර ඇත. ගොවි සංවිධානයේ ලේකම් ඔබ යැයි සිතා ඒ සඳහා අවශ්‍ය අවසර ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරී වෙත යවන රාජකාරී ලිපිය සකස් කරන්න. (වචන 100ක් පමණ යොදා.) (ලකුණු 15යි)

papers.lk

40413

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

කාලය : පැය 02 යි.

නම/විභාග අංකය :- ..................................................

වැදගත්:- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු ගණන 80කි.

01. (i) "මම දෙවියෙකි. සියලු දඹදිව අඟනක් රජපුරු කොතොකුන් සම්පයේ සිටි ගසක් නොදිටිමි."
(අ) උක්ත පාඨය ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.
(ආ) එම ග්‍රන්ථය ලියැවුණු සාහිත්‍ය යුගය නම් කරන්න.

(ii) අප බෝසතුන් මෙන
අගනෙකු පොමා ඇසන ලෙස
සුර රජ සිට ඇසය
..................................................
(අ) මෙම කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ආ) එය උපුටාගත් ග්‍රන්ථයේ නම ලියන්න.

(iii) ඇස නැති දා යොත ගන්නේ සියන්නටද
දත නැති දා උන් දමු ගිනි ගසින්නටද
වෙර නැති දා ගහගන්නේ දිනන්නටද
පුද ඇති දා නැති කග තොප් තොරන්නටද
(අ) මෙම කවියෙන් ලබාදෙන උපදේශය කුමක් ද?
(ආ) කඩුව, වීර්යය යන අරුත් දෙන පද දෙක පද්‍යයෙන් උපුටා ලියන්න.

(iv) දේවයන් වහන්ස, කෙවට්ටයා මැණිකකින් වැරදුණු කරුණු කැමැත්තෙමි.
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවු ද?
(ආ) "දේවයන් වහන්ස." යනුවෙන් අමතුවේ කාහට ද?

(v) "මේ ගම් දැන් ගොල්ලන් අධිකොඩ විරංගු යකුන් අරයිගන් කාලෙන්ගී ගමකි."
(අ) මෙම සිතුවිල්ල කාගේ ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කෘතිය සිංහලයට අනුවර්තනය කළේ කවරෙක් ද?

(vi) (අ) ගුත්තිල කාව්‍යය රචනා කිරීමේ දී ඇසුරු කරගත් මූලාශ්‍රය නම් කරන්න.
(ආ) ගුත්තිල කාව්‍ය ලිවීමට ආරාධනය කරනු ලැබුවේ කවරකු විසින් ද?

(vii) "නො බව මැනව දේවයන් වහන්ස, රාජ්‍ය සුව අනුභව කළ මැනව"
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුද?
(ආ) මෙසේ ප්‍රකාශ කළේ කුමන අවස්ථාවේද?

(viii) "ඔව් මං හිතනවා මිනිහා මැරිලා ටී සිපල. හිරගෙදරට යන මිනිස්සු උන් හිටි හැටියෙ මැරෙනවා."
(අ) මේ ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) 'මිනිහා' යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන් ද?

(ix) (අ) ජාතකවලට දිගු ඉතිහාසයක් ඇති බව සඳහන් සංයුක්ත නිකායට්ඨ කථාව කුමක් ද?
(ආ) එය රචනා වූ යුගය නම් කරන්න.

(x) (අ) ගුත්තිල කාව්‍යයේ බෝසතුන්ට අභියෝග කළ තරුණ ගාන්ධර්වයා කවු ද?
(ආ) වීණා වාදන තරගයෙන් ජය ලැබීමට බෝසතුන්ට උපකාර වූයේ කවු ද?

(ලකුණු 2 × 10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "හොඳයි, කරුණාව වේලිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනවා නේ! ඒත් උඹ ඉල්ලුන්නේ වේලිච්ච කුඹුරට තවත් නියඟ. මං දන්නවා මිනිහා මෙහෙම හිටියා."

(අ) මේ පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) අසන රිසින් නයි සැල    මහනෙළ්යා
මවුන් වෙතම සිටිනා    ගුරුළේයා
වයන ඒ වෙණ නද පලාබ ම    තැළේයා
එළිත වැසිර පිත සිහි නො    තැළේයා

(අ) ඉහත අවස්ථාවේ වෙණ වයනෝ කවරහු ද?

(ආ) ඉහත පද්‍යයේ අදහස සරල බසින් ලියන්න.

(iii) "මිනු ඇඹුල දණේට වළල්ලේ ග්‍රා 'තොල බුත්මැඳත්තයන්ගේ අරුසයෙහි, සයින් තෝම්පැ තෙල මල තබා හිස පැලඳ ගෙන ඇඹුල දඹු හුපාගෙන බඩ පුරා කා වියව'"

(අ) ඇඳිත පදවලට අර්ථය සපයන්න.

(ආ) ඉහත අවස්ථාව කෙටියෙන් විස්තර කරන්න.

(iv) වරද පෙනෙන තරමට වැරදුණා    නොවේ
වරද ඇතත් හිතරුණෙ වැඩ කළා    නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට    ලොවේ
වරද නැති කෙනෙක් නැත සතිය මේ    ලොවේ

(අ) ඉහත කවියෙන් දැක්වෙන පරිදි වරද පෙනෙන්නේ කවුරුන් හටද?

(ආ) කවියෙන් දෙන උපදේශය කුමක්ද?

(v) පටන් පුරිදු පුන් උපදෙස්    සිහිකොට
ඉටත් බෙලහුන් ලැමුවෙන් ගුලී    අහසට
ගුවන් වචන පුර අගෙහෝ බැස    සිට
පටන් ගත්තු නව සිපයක්    නැටුමට

(අ) ඉරි ඇඳි පදවල අර්ථ සපයන්න.

(ආ) අදාළ අවස්ථාව කෙටියෙන් ලියන්න. (ලකුණු 4 × 5 = 20)

03. උම්මග්ග ජාතකයේ,
(අ) මහෞෂධයන්ගේ චරිතයෙන්
(ආ) සේවිට්ටයන්ගේ චරිතයෙන්
ඔවුන් තුළ තිබූ දැඩි උපක්‍රමශීලීත්වය ප්‍රකට වේ. සුදුසු උදාහරණ දෙක බැගින් දෙමින් ඉහත ප්‍රකාශය විමසන්න.

නැතහොත්

(අ) සරල බස්වහරක් යොදා ගැනීම
(ආ) සරල උපමා රූපක භාවිතය
ජනකවි සාහිත්‍යය තුළ දැකිය හැකිය. 'නානා රීය පාගා අඹතෙරෙන් ආගේ'. කවි පන්තියෙන් නිදසුන් දෙක බැගින් දක්වමින් විග්‍රහ කරන්න. (ලකුණු 15)

04. බැද්දේගම නවකතාවේ
(අ) ගැමියන්ගේ ක්‍රියාකලාපය
(ආ) ස්වාභාවික පරිසරය
ගමේ පරිසරය ලඟා කරදීමට ඉවහල් වී ඇත. නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්

ගුත්තිල කාව්‍යය කතුවරයා
(අ) සරල බස්වහරක් ද
(ආ) විචිත් බස්වහරක් ද
ස්වකීය නිර්මාණයේ දී භාවිත කර ඇත. සුදුසු උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. බැද්දේගම සුන්දරත්වයෙන් පිරුණු විශාල ගමක් නොව කටුක බවින් හා දරිද්‍රතාවයෙන් පිරුණු ගමකි. සුදුසු උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. ගුත්තිල කතුවරයා වීණා වාදනයේ මිහිරියාව ඉස්මතු කරන්නේ අවට පරිසරයේ පිළිබිඹු සමග ගළපීමෙනි. සුදුසු උදාහරණ තුනක්වත් දෙමින් ඉහත කියමන පහදන්න. (ලකුණු 10)

07. උම්මග්ග ජාතකයේ මහෞෂධයන්ගේ චරිතය තුළින් ප්‍රඥාවෙන් අභියෝගයන් ජයගත හැකි බව පෙන්වා දෙයි. සුදුසු උදාහරණ තුනක්වත් දෙමින් විමසන්න. (ලකුණු 10)



papers.lk